# ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය වෙනුවෙන් වන ජාතික ප්‍රතිඥාවයි

ශ්‍රී ලංකාව තුළ
ජාතික ඒකාබද්ධතා සංකල්පය
යථාර්තයක් කර ගැනීමේ පරම අභිලාෂයෙන්
ජාති,ආගම්,ප්‍රාදේශීය හා භාෂා ආදී
විවිධත්වයන් පැවතිය ද
ඒවාට ගරු කරමින්
අපි සැවොම ශ්‍රී ලාංකිකයන් වශයෙන්
මෙසේ ප්‍රතිඥා දෙමු.

අපි එකම සහෝදරාත්මක
මානව කැලක සාමාජිකයන් වෙමු.
මනා අවබෝධයෙන් , විශ්වාසයෙන් හා
අසීමිත සහෝදරත්වයෙන් යුතුව
ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන් හා
ප්‍රජාවන් අතර සමගිය ඇති කිරීමේ
අධිෂ්ඨානයෙන් යුතුව අපි කටයුතු කරමු.

අපි ඒ උතුම් පරමාර්ථය වෙනුවෙන්
එකිනෙකා සමඟ අත්වැල් බැඳගන්නා බවටත්,
එමගින් සමෘද්ධිමත් දේශයක්,
ශ්‍රී ලාංකික අනන්‍යතාවයක්
ගොඩනගන බවටත් ප්‍රතිඥා දෙමු.

තිරසර සංවර්ධනය හා සමෘද්ධිය උදෙසා
එකාබද්ධතාවය, ප්‍රතිසන්ධානය හා කල්පවත්නා සාමය
නියත අවශ්‍යතාවයක් බව
අවබෝධ කරගෙන
එය යථාර්ථයක් බවට පත්කරලීමට ප්‍රතිඥා දෙමු...